වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2024** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2024** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	1,398,800	1,398,800	—	—
9152	යන්ත්‍රෝපකරණ	28,983,979.93	28,983,979.93	—	—
9153	ඉඩම	—	—	—	—
9154	අස්පෘශ්‍ය වත්කම්	—	—	—	—
9155	ජීව විද්‍යාත්මක වත්කම	—	—	—	—
9160	කෙරීගෙන යන වැඩ	—	—	—	—
9180	බදු දෙන ලද වත්කම	—	—	—	—

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය / எனது இல. / My No. } සිඒඒ/සි/ඩීසිආර්/2/2024/25

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2025 මැයි 19 දින



අධ්‍යක්ෂ
ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

ශීර්ෂය 203 - ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 203 - ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මූදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙන්ත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ , මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මූදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සම්ස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 අග්‍රිම කළමනාකරණය

වර්ෂය තුළ සැලසුම් කළ පරිදි භාණ්ඩාගාරය විසින් අග්‍රිම නිකුත් නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 05 කට පාර්ලිමේන්තුව විසින් යලසා තිබූ ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබූ අතර ඊට අදාළව සියයට 9 සිට සියයට 44 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි.

3.2 වියදම් කළමනාකරණය

අ. පුනරාවර්තන වැය විෂයයන් 10ක් සඳහා ප්‍රතිපාදිත එකතුව රු.40,965,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.30,153,386ක් ඉතිරි වී තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 30 සිට සියයට 92 දක්වා පරාසයක් ගෙන තිබුණි.

ආ. මූලධන වැය විෂයයන් 05ක් සඳහා ප්‍රතිපාදිත එකතුව රු.3,350,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.2,136,746ක් ඉතිරි වී තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 43 සිට සියයට 94 දක්වා පරාසයක් ගෙන තිබුණි.

ඇ. එක් පුනරාවර්තන වැය විෂයයක් සඳහා ප්‍රතිපාදිත රු.50,000ක් වූ සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, සමාලෝචිත වර්ෂයේ ජුනි මාසයෙන් පසු එවැනි සමාලෝචනයක් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූලික් රෙගුලාසි සංග්‍රහයෙහි මූලික් රෙගුලාසි 104(4) ප්‍රකාරව අලාභයන් පිළිබඳ අවසන් වාර්තාව අලාභ හානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත දී ඉදිරිපත් කළ යුතු වුවත් 2024 මැයි 06 දින දෙපාර්තමේන්තුවේ වාහනයක් සම්බන්ධයෙන් සිදු වී තිබූ අනතුරට අදාළ වාර්තාව 2025 අප්‍රේල් මස 22 දින ඉදිරිපත් කර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු වුවද, 2024 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම සඳහා අනුමැතිය ලබා ගැනීම 2024 පෙබරවාරි 02 දින සිදු කර තිබුණි.

4.1.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

2017 වර්ෂයේ ඉදිකර නිම කිරීමට අපේක්ෂා කර තිබුණු මරදමඩු දේවස්ථානයේ වන්දනා ගෘහය සඳහා සමාලෝචිත වර්ෂයේදීත් රු.මිලියන 7.15ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද, ව්‍යාපෘතියේ වැඩ කටයුතු නිම කර නොතිබුණි.

4.2 වත්කම් කළමනාකරණය

අ. 2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන භාණ්ඩාගාර ලේකම්ගේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව 2024 වර්ෂය සඳහා වූ වත්කම් මිලදී ගැනීම හා අපහරණය පිළිබඳ තොරතුරු කොමිට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

ආ. 2006 වර්ෂයේ දී ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව වෙත පවරා තිබූ තලෙවිල චාරිකා නිවාසය පිහිටි ඉඩමේ අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.3 කළමනාකරණ දුර්වලතා

අ. මියගිය හා විශ්‍රාමගිය නිලධාරීන්ගෙන් අය විය යුතු එකතුව රු.244,190 ක ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ආ. 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර නොතිබුණි.

ඇ. දහම් පාසැල් ගුරුවරුන්ට දීමනා, නිල ඇඳුම් වැනි අනුග්‍රහයන් ලබාදීමේදී ලියාපදිංචිය සම්බන්ධයෙන් සලකා බැලුවද, පවත්නා කතෝලික, ක්‍රිස්තියානි දේවස්ථාන හා ආගමික මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීමේ විධිමත් ක්‍රමවේදයක් නොමැති බවත් ඊට අදාළ දේවස්ථාන

හා ආගමික මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම සඳහා කෙටුම්පත් කර ඇති පනත අනුමත කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

ඈ. දෙපාර්තමේන්තු වාහනයක් සම්බන්ධයෙන් සිදු වූ අනතුරකට අදාළව සිදුව තිබූ රු.137,707 ක් වූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

5. යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත වාර්තා ඉදිරිපත් කළ යුතු වුවත් 2024 වර්ෂය සඳහා අදාළ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

5.2 අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 134 (2) සහ 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01/2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කිරීම විගණකාධිපති විමසා සිදු කල යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කිරීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

අ. සමාලෝචිත වර්ෂයට අදාළ දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 59 ක් සහ තථ්‍ය කාර්ය මණ්ඩලය 53ක් වූ අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ සහකාර අධ්‍යක්ෂ තනතුරක්, ද්විතීක මට්ටමේ තනතුරු 04ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 01ක් වශයෙන් තනතුරු 06 කට අදාළ ව පුරප්පාඩු පැවතුණි.

ආ. 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 05 ක් එකම සේවා ස්ථානයේ සේවය කර ඇති නිලධාරියෙකුට වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරු ලබා දිය යුතු වුවත් 2024 දෙසැම්බර් 31 දිනට වසර 5 ක සිට 19 දක්වා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන් 34 දෙනෙකු සඳහා ස්ථාන මාරු වීම් ලබා දීමට කටයුතු කර නොතිබුණි.

ආර්.එස්.කටුගම්පල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
වැඩබලන විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය 04
කාර්ය සාධක දර්ශක - ආයතනයේ කාර්ය සාධක දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

මූල්‍ය වගකීම්	සැලසුම්කර ඇති ප්‍රධාන කාර්යයන්	ප්‍රමුඛ කාර්යය සාධක දර්ශක	ඇස්තමේන්තුගත සංශෝධිත වාර්ෂික පිරිවැය රු.මිලි. (අදාලනම් පමණි)	ප්‍රගතිය		බැහැරවීමක් ඇත්නම් එයට හේතුව
				භෞතික (ප්‍රමාණාත්මක %)	මූල්‍ය %	
1508(17)	මූල්‍ය අවශ්‍යතා වලදී දේවස්ථාන සහ අනෙකුත් ආගමික සංවිධානවලට සහය විම. අධ්‍යාත්මික පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන් හා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් හා ආගමික සහජීවන වැඩසටහන් සංවිධානය කිරීම.	ආගමික සහජීවන වැඩසටහන් පවුල් පෝෂණ වැඩසටහන් තරුණ්‍ය සඳහා වැඩසටහන්, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්.	2	100%	89%	දෙසැම්බර් මස බිල්පත් සඳහා අක්මුදල් නොලැබීම.
1508(18)	පාස්කු මංගල්‍ය වැඩසටහන්	පසම් තෙවන වෙළුම එළිදැක්වීම	3.5	100%	100%	
	ජාතික නත්තල් වැඩසටහන්	අන්තර් ආගමික නත්තල් වැඩසටහන් / නත්තල් තැපැල් මුද්දර චිත්‍ර තරගය පැවැත්වීම	1	100%	100%	
	අනෙකුත් ජාතික හා ආගමික අවස්ථා සංවිධානය කිරීම හා විවිධ කටයුතු	ජාතික නිදහස් උත්සවය වෙසක් උත්සවය	0.5	100%	100%	

2-1409	කිතුනු කලා ශිල්ප	පසම් අස්පෘෂ්‍ය උරුමයක් බවට ප්‍රකාශ කිරීමට අදාල දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	0.5	95%	63%	අක්මුදල් නොලැබීම
	ජනවන්දනා, කිතුණු කලා ශිල්ප හා සංස්කෘතික කටයුතු, ධර්ම ප්‍රභාෂ්වර සම්මාන උළෙල.	ක්‍රිස්තියානි ආගමික සාහිත්‍ය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ධර්ම ප්‍රභාෂ්වර සම්මාන උළෙල සංස්කෘතික කටයුතු ජනවන්දනා	2.5	100%	100%	
	කිතුනු දහම පිළිබඳ ප්‍රකාශන මිලදී ගැනීම හා දහම් පාසල් පුස්තකාල වැඩසටහන්	කිතුනු දහම පිළිබඳ ප්‍රකාශන මිලදී ගැනීම හා දහම් පාසල් පුස්තකාල වැඩසටහන	1.5	80%	-	අක්මුදල් නොලැබීම
04-1508	වන්දනා ගමන් ආඥා පණත යටතේ ප්‍රකාශිත දේවස්ථානයන්ගේ මංගල්‍යයන් පැවැත්වීම	සිද්ධස්ථාන මංගල්‍යයන් 25 ක් සඳහා දායකත්වය ලබා දීම	8	100%	88%	කව්වතීවු මංගල්‍ය සඳහා නාවික හමුදාව මගින් මුදල් වෙන්කර තිබූ නිසා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන අවශ්‍ය නොවීම හා දෙසැම්බර් මස බිල්පත් සඳහා අක්මුදල් නොලැබීම.
05-1508	ආගමික අධ්‍යාපනය හා දහම් පාසල් ක්‍රියාකාරකම්	බයිබල් දැනුම මිණුම තරගාවලිය හා රචනා තරගාවලිය	8	98%	92%	සාමාන්‍ය ඉතිරියකි
		ආගමික හා දහම්පාසල් ක්‍රියාකරකම්	2	100%	60%	අක්මුදල් නොලැබීම
		කතෝලික දහම්පාසල් අවසාන සහතිකපත්‍ර විභාගය සහ ධර්මාචාර්ය විභාගය පැවැත්වීම	28	-	8%	ජා.අ.ව.අ. 01/2023 අනුව රාජ්‍ය වියදම් පාලනය හා විභාග දෙපාර්තමේන්තුව විසින් දහම්පාසල් අවසන් ශ්‍රේණි විභාගය හා ධර්මාචාර්ය විභාගය සඳහා ප්‍රතිපාදන අවශ්‍ය නොවන බව දැන්වීම.

17-1501	දහම් පාසල් ගුරුවරුන් සඳහා පහසුකම් සැපයීම	දහම් ගුරු පුස්තකාල දීමනාව	82	100%	95%	සාමාන්‍ය ඉතිරියකි.
11-2205	වන්දනා ගමන් ආඥා පණත යටතේ ප්‍රසිද්ධියට පත් කර ඇති සිද්ධස්ථානවලට පැමිණෙන වන්දනාකරුවන්ට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම	සිද්ධස්ථාන 03 ක් සඳහා ප්‍රතිපාදන ලබා දීම	7.15	100%	96%	සාමාන්‍ය ඉතිරියකි.
14-2205	පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු ආගමික ස්ථාන සංවර්ධනය	ආගමික ස්ථාන 03 සඳහා ආධාර ලබා දීම	3	100%	96%	සාමාන්‍ය ඉතිරියකි.
18-2205	ක්‍රිස්තියානි ආගමික ස්ථාන හා දේවස්ථාන සඳහාපහසුකම් සැලසීම	ක්‍රිස්තියානි ආගමික ස්ථාන හා දේවස්ථාන 08ක් සඳහා	10	100%	91%	දෙසැම්බර් මස බිල්පත් සඳහා අක්මුදල් නොලැබීම.

පරිච්ඡේදය 05
තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය
හඳුනා ගත්තා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය/ අරමුණ		ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය 0%-49% 50%-74% 75% - 100%
1508(17)	අධ්‍යාත්මික පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන් හා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් හා ආගමික සහජීවන වැඩසටහන් සංවිධානය කිරීම.	නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම.	හානිකර මද්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැලැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම	75%-100%
			දුම්කොළ භාවිත පාලනය කිරීම සඳහා වූ ලෝක සෞඛ්‍ය සංවිධානයේ වැඩ සැලැස්ම සියලුම රටවලට අදාල වන පරිදි ශක්තිමත් කිරීම හා ක්‍රියාවට නැංවීම	
1508(18)	ජාතික නත්තල් වැඩසටහන් සංවිධානය කිරීම, නත්තල් තැපැල් චිත්‍ර තරගය පැවැත්වීම.	‘‘ජේසු උපත’’ මඟින් ගෙනෙන ප්‍රේමයේ පණිවිඩය ජාතික උත්සවය හරහා සමාජානුයෝජනය කරලීම.	සාමකාමී සමාජයකට කිතුණුවන් මෙහෙයවීම	75% - 100%
	අනෙකුත් ජාතික හා ආගමික අවස්ථා සංවිධානය කිරීම හා විවිධ කටයුතු	සෑම කිතුණුවකගේම අධ්‍යාත්මික ජීවිතය ශක්තිමත් කරලීම	සාමකාමී සමාජයකට කිතුණුවන් මෙහෙයවීම	75% - 100%

	කිතුනු ආගමික සාහිත්‍ය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	ලේඛණ,රංගනය,මඟින් පෞරුෂත්වය වර්ධනය කිරීම.	කිතුණු කලා රසාස්වාදන උසස් මට්ටමකට ගෙන ඒම හා එ සඳහා උනන්දුවක් දක්වන්නන් ඇගයීමකට ලක් කිරීම.අනාගතයට ප්‍රශස්ත කලාකරුවන් දයාද කිරීම.	75% - 100%
	කිතුනු දහම පිළිබඳ ප්‍රකාශන මිලදී ගැනීම හා දහම් පාසල් පුස්තකාල වැඩසටහන	පරිපූර්ණ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබා සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රවණඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිමය වශයෙන් දායකවීම.	75%-100%
02-1409	ජනවන්දනාව, කිතුනු කලාශිල්ප හා සංස්කෘතික කටයුතු කිතුණු ගීතිකා වැඩසටහන් පැවැත්වම, ධර්ම ප්‍රභාෂ්වර කිතුණු සම්මාන උළෙල හා කලා භූෂණ සම්මාන උළෙල සඳහා දායක්තවය ලබා දීම, විවිධ කලා හා සාහිත්‍යා වැඩසටහන් සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම.	පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබා සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රවණඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිමය වශයෙන් දායකවීම.	75%-100%

04-1508	වන්දනා ගමන් ආඥා පණත යටතේ ප්‍රකාශිත දේවස්ථානයන්ගේ මංගල්‍යයන් පැවැත්වීම	නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	ලෝකයේ ස්භාවික සහ සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම	75% - 100%
05-1508	ආගමික අධ්‍යාපනය හා දහම් පාසල් ක්‍රියාකාරකම්	පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබා සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රවණඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිමය වශයෙන් දායකවීම	75% - 100%
17-1501	දහම් පාසල් ගුරුවරුන් සඳහා පහසුකම් සැපයීම	පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබා සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රවණඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිමය වශයෙන් දායකවීම	75%-100%
11-2205	වන්දනා ගමන් ආඥා පණත යටතේ ප්‍රසිද්ධියට පත් කර ඇති සිද්ධස්ථානවලට පැමිණෙන වන්දනාකරුවන්ට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම	නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	ලෝකයේ ස්භාවික සහ සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම	75%-100%

14-2205	පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු ආගමික ස්ථාන සංවර්ධනය		පෞරාණික වටිනාකම් සහිත දේවස්ථාන සහ ආගමික ස්ථාන වැනි කිතුණු උරුමයන් අනාගත පුරපුර වෙනුවෙන් රැක ගැනීම	75%-100%
18-2205	දේවස්ථානයන්හි ඉදිකිරීම්, පුනරුත්ථාපනය කිරීම් හා යටිතල පහසුකම් සංවර්ධනය	නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	ලෝකයේ ස්භාවික සහ සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම	75%-100%

දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන බොහෝ කාර්යයන් ප්‍රමාණාත්මක ව මැනිය නොහැකි කාර්යයන් වීම මත නිශ්චිත ව තිරසර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීම දුෂ්කර විය. එසේ වුව ද දෙපාර්තමේන්තු දැක්ම හා මෙහෙවර අනුව හඳුනාගන්නා ලද තිරසර අරමුණු කරා බොහෝ දුරට ළඟා වීමට දෙපාර්තමේන්තුවට හැකිවිය. සියලුම වැඩසටහන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් සංවිධානය කොට තිබූ වැඩසටහන් කිහිපයක් සඳහා ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව විසින්ම සම්පාදනය කරගනිමින් හැකිතාක්දුරට ඉලක්කගත කාර්ය සාධනය කරා ළඟා වීමට දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජේෂ්ඨ	03	02	01
තෘතියික	01	01	00
ද්විතියික	50	46	04
ප්‍රාථමික	06	04	02

6.2. සේවක සංඛ්‍යා කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ, ගණකාධිකාරී යන තනතුරු 03න් සහකාර අධ්‍යක්ෂ තනතුර පමණක් පුරප්පාඩුව පවතී. සංවර්ධන නිලධාරීන් නොමැති පලාත්වල වැඩසටහන්, තරඟ හා සංවර්ධන කටයුතු දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරීන් යොදවා ආවරණය කර ගැනීමට කටයුතු කරන ලදී. ඒ අනුව පවත්නා මානව සම්පත අභිප්‍රේරණය කරමින් ඔවුන්ගේ ආයකත්වය උපරිම වශයෙන් දෙපාර්තමේන්තු කාර්ය සාධනය පවත්වා ගැනීමට උපයෝජනය කොටගෙන ඇත.

6.3. මානව සම්පත් සංවර්ධනය

අනුඅංකය	වවුචරය සැකසූදිනය	පුහුණු වැඩසටහන	ගෙවීම් කරන්නාගේනම	වියදම (රු)
1	12/20/2024	දෙපාර්තමේන්තු නිලධාරීන් 10 වෙනුවෙන් SDFL ආයතනය මගින් පැවැත්වූ පුහුණු වැඩලුව	නිපුණතා සංවර්ධන අරමුදල	70,000.00
2	14/03/2024	දෙපාර්තමේන්තු නිලධාරීන් 02 වෙනුවෙන් SDFL ආයතනය මගින් පැවැත්වූ පුහුණු වැඩලුව	නිපුණතා සංවර්ධන අරමුදල	42,000.00

පරිච්ඡේදය 07

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1.	**පහතසඳහන්මූල්යප්‍රකාශ/ ගිණුම්නියමිතදිනටඉදිරිපත්කොටතිබේ**			
1.1.	වාර්ෂිකමූල්‍යප්‍රකාශ	අනුකූලවේ		
1.2.	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූලවේ		
1.3.	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නොවේ		
1.4.	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.5.	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.6.	වෙනත්	අදාල නොවේ		
2.	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1.	රාජ්‍යපරිපාලනචක්‍ර ලේඛ 267/2018 අනුවස්ථාවරවත්කම්ලේඛනයයාවත්කාලීනකරපවත්වාගෙනයාම	අනුකූලවේ		
2.2.	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.3.	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.4.	අභ්‍යන්තරවිගණනවාර්තාලේඛනයයාවත්කාලීනකර පවත්වාගෙනයාම	අනුකූලවේ		
2.5.	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
2.6.	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.7.	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.8.	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		

2.9.	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10.	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11.	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3.	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1.	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2.	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3.	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4.	2014.05.11 දිනැතිඅංක171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයඅනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයු තුකිරීම	අනුකූල වේ		
4.	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

5.	**විගණන විමසුම්**			
5.1.	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්ති ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7.	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව,අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 4ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ		
8.	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකණ චක්‍ර ලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කෝම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රෙල්ඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රෙල්ඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු ප් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රෙල්ඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ශණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රෙල්ඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලෝග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛයේ 3.1 ඡේදයේ සඳහන් වියි විධාන ප්‍රකාරව ,වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ	.	
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ ටල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බලකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාෂ වලින් අනාවරණය වූ හා ගැලපුම කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇරතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවාගේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉදිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට **එලඹීම**	අනුකූල වේ		

12	**රජයේ නිලධාරීන් ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුලු කර තිබීම.	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙමු.රේ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සදහා වන පාලන ගිණුම යාවත්කාලින කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රේ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම,එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රේ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස්කර තිබූ ආදායම්,තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රේ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
16	**මානව සම්පත් කළමණාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ		

16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍ර ලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරණ සේවා දේපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛණයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර , වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයා ගේ ප්‍රශංසා /චෝදනා පළ කිරීමට පහසුකම් සළසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2008(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥාප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධික්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැළැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැළැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා ම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැළැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		

19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳවගකිම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කොට තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවිරදි කොට තිබීම.	අනුකූල වේ		